# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බදුල්ල
## மாவட்ட செயலகம் - பதுளை
## District Secretariat - Badulla

| | | | | |
|---|---|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් / District Secretary / மாவட்ட செயலாளர் | ☎ 055 2222235 / 🖷 055 2222233 | කාර්යාලය / Office / அலுவலகம் | ☎ 055 2222510 / 🖷 055 2222292 | වෙබ් අඩවිය හා විද්‍යුත් ලිපිනය Web site & email இணையத்தளம் மற்றும் மின்னஞ்சல் — www.badulla.dist.gov.lk — bdchmao@gmail.com |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No | BD/EHM/3/2/17 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No | | දිනය / திகதி / Date | 2026.05.08 |

බදුල්ල දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් හා
බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අංශ ප්‍රධානින් වෙත.

**<u>ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම - 2026</u>**
**<u>(දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර)</u>**
**<u>සංවර්ධන නිලධාරී සේවය, කළමනාකරණ සේවා නිලධාරී සේවය, තොරතුරු හා සන්නිවේදන සහකාර සේවය, ඒකාබද්ධ රියදුරු සේවය, කාර්යාල සේවක සේවය</u>**

මෙ සමඟ අමුණා ඇති උපලේඛනයේ සඳහන් ස්ථාන මාරුවීම 2026.06.15 දින හෝ නිලධරයන්ගේ නම වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත කරමි. මෙ බව කාර්යාලයේ/අංශයේ අදාළ නිලධාරින් වෙත දන්වා නියමිත දිනයේදී අභිනව කාර්ය ස්ථානයේ වැඩ භාර ගන්නා ලෙස ඔවුන්ට දැනුම් දෙනු මැනවි.

02. මෙම ස්ථාන මාරුවීම සිදු කිරිමේදී ස්ථානමාරු කමිටුව විසින් අනුගමනය කරන ලද ස්ථාන මාරු පටිපාටිය, 2025.07.21 දිනැති අංක 02/2025 දරණ ඒකාබද්ධ සේවා චක්‍රලේඛයෙහි ඇතුළත්ව ඇත. එම චක්‍රලේඛයෙහි හෝ අංක 2310/29 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ ඇතුළත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 1) හි XVIII පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව තමන්ගේ ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳව වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ අවධානයට යොමු වී නොමැත්තේ නම් පමණක් වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව වෙත අභියාචනා ඉදිරිපත් කළ හැකිය. තම අභියාචනය 2026.05.22 දිනට පෙර ආයතන ප්‍රධානියා මඟින් වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුව වෙත යොමු කරන ලෙසද කාරුණිකව දන්වමි.

03. දැනට සේවය කරන කාර්යාලයේ නියමිත කාලය සම්පූර්ණ කර නොමැති නිලධරයන්ට මෙම වාර්ෂික ස්ථාන මාරු වෙනුවෙන් ගමන් වියදම් ගෙවනු නොලැබේ. නියමිත කාලය සම්පූර්ණ කර ඇති නිලධරයන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට යටත්ව ගමන් වියදම් ගෙවිය යුතු වේ. උපවේශන දීමනා ගෙවනු නොලැබේ.

04. තවද මෙ සමඟ වූ උපලේඛනයේ ස්ථාන මාරු ලැබ ඇති යම් නිලධාරියෙක් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදු කරන ලද වාර්ෂික ස්ථාන මාරු යටතේ ද ස්ථාන මාරු ලැබ ඇත්නම්, එහිදී ක්‍රියාත්මක විය යුත්තේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදු කරන ලද ස්ථාන මාරු නියෝගය වන අතර, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබාදෙන ලද ස්ථාන මාරුව අවලංගු වුවහොත් මෙම ස්ථාන මාරුව ක්‍රියාත්මක විය යුතු බව ද දන්වමි.

සුනිල් හලගම
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති
බදුල්ල.

දුරකථනඅංකය :- 055 223 2306/055 222 2510
ෆැක්ස් අංකය :- 055 222 2292
විද්‍යුත් ලිපිනය :- bdehmao@gmail.com

පිටපත :- 01. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් - කරු. දැ.ගැ.සඳහා




CamScanner